# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
காணி, காணி அபிவிருத்தி அமைச்சு
**Ministry of Land and Land Development**

"ගොවිජන මන්දිරය", 80/5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල. "கொவிஜன மந்திரய", 80/5, ராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
"Govijana Mandiraya", 80/5, Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.

මගේ අංකය
எனது இல.
My No

මබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date


එල්ඩී 4 1-අමා. චක්‍රලේඛ

2008.12 31

චක්‍රලේඛ අංක 2008/1

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)

## රජයේ ඉඩම් මැනීම් සඳහා ලැබෙන ඉල්ලීම් ක්‍රමානුකූල කිරීම

රජයේ ඉඩම් මැනුම් කටයුතු සඳහා ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය දිනෙන් දින වැඩිවීමත් ඇතැම් මැනුම් කටයුතු සඳහා විශාල වියදමක් දරා සිදු කළද ඒවා නිසි ප්‍රයෝජනයකට නොගන්නා බව පෙනී යන නිසාත්, මේ වන විට මැනුම් දෙපාර්තමේන්තුව තුළ මැනුම් නිලධාරීන්ගේ හිඟයක් පවතින නිසා රජයේ ඉඩම් මැනුම් කිරීම සඳහා ලැබෙන ඉල්ලීම් ක්‍රමානුකූල කිරීමටත්, අවශ්‍ය මැනුම් පමණක් තෝරා බේරාගෙන ඉටු කිරීම මඟින් රජයේ සම්පත් ආරක්ෂා කර ගැනීමටත්, පියවර ගැනීම අවශ්‍ය බව පෙනී ගොස් ඇත. ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීමක් ඇති කිරීමටත්, එම කටයුතු විධිමත් කිරීමත් අරමුණු කරගෙන මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන අතර මෙහි සඳහන් උපදෙස් පරිදි ක්‍රියා කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

### 1. වාර්ෂික මැනුම් සැලැස්මක් පිළියෙල කර ගැනීම

යම් වර්ෂයකදී සිදු කළ යුතු මැනුම් මොනවාද යන්න ගැන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් රට පෙර වර්ෂයේ සැප්තැම්බර් මස වන විට මැනුම්පති විසින් තීරණය කර සැලැස්මක් සකස් කරනු ලැබේ. එසේ සැලැස්මක් පිළියෙල කළ පසු විවිධ නව ඉල්ලීම් ඉදිරිපත් කරමින් ඒ සඳහා ප්‍රමුඛතාව දෙන ලෙසට ඉල්ලීම් රාශියක් ලැබේ. මෙවැනි ඉල්ලීම් සඳහා අවශ්‍ය නිලධාරීන් යෙදවීම පවතින නිලධාරී හිඟය නිසා මැනුම් දෙපාර්තමේන්තුවට විශාල ගැටලුවකි. එබැවින් සෑම අමාත්‍යාංශයක් දෙපාර්තමේන්තුවක් හා ප්‍රාදේශීය ලේකම් වරයෙක්ම තමන්ගේ විෂයන්ට අදාළ මැනුම් වාර්ෂික වැඩ සටහන ප්‍රමුඛතා ගත කර ගැනීම අනිවාර්යෙන් කළ යුතුය. 2009 ජනවාරි මාසය තුළ ඒ ඒ පළාත් වල පළාත් සර්වේයර් ජනරාල්වරුන් විසින් මැනුම් ඉල්ලීම් පිළිබඳව අදාළ වාර්තාව කැඳවා සාකච්ඡාවක් පවත්වන අතර එහිදී ගනු ලබන තීරණ මත අවශ්‍ය වාර්ෂික මැනුම් සැලසුම් සකස් කරනු ඇත. රජයේ හදිසි සංවර්ධන සැලසුම් මත හෝ මෙම අමාත්‍යාංශය උපදෙස් දෙන හදිසි වැඩසටහන් වලදී මිස සැලැස්මට පරිබාහිරව ලැබෙන ඉල්ලීම් ගැන ක්‍රියා නොකිරීමට මින් ඉදිරියට ක්‍රියා කරනු ඇත.

මේ නිසා සියලුම ආයතන වාර්ෂිකව තම මැනුම් සැලැස්ම පිළියෙල කර ප්‍රමුඛතා ගත කර ඒ ඒ පළාත් වල පළාත් සර්වේ ජනරාල් වෙත 2009 ජනවාරි 15 දිනට පෙර අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුවේ. විශේෂයෙන් ප්‍රාදේශීය ලේකම් වරුන් විවිධ පනත් යටතේ සිදු කර ගැනීමට අපේක්ෂා කරන මැනුම් වැඩ කල් ඇතිව හඳුනාගෙන ප්‍රමුඛතා ගත කර ගැනීම ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතු බවට මෙයින් උපදෙස් දෙමි.

### 2. මැනුම් ඉල්ලීම් නිකුත් කිරීම

රජයේ ඉඩම් මැනීම සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් වලින් මැනුම්පති විසින් අවශ්‍ය පියවර ගන්නේ පහත සඳහන් බලයලත් නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් පමණි.

i. අදාළ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)
ii. රජයට ඉඩම් අත්කර ගැනීම සඳහා බලය පවරනු ලැබූ අත්කර ගැනීමේ නිලධාරීන්
iii. නිරවුල් කිරීමේ කොමසාරිස්
iv. හිමිකම් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්
v. මහවැලි අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරීන්
vi. මීට අතිරේකව ඉඩම් අමාත්‍යාංශ ලේකම් හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ විශේෂ ඉල්ලීම් සම්බන්ධයෙන්ද මැනුම්පති විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

මීට අමතරව මැනුම්පති විසින්

i. උසාවි මැනුම්
ii. රජයේ සංවර්ධන කටයුතු සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන අධිකාරිය
ඉ.ප්‍ර.කො මගින් කරනු ලබන ඉල්ලීම් පිළිබඳවද කටයුතු කරනු ඇත.

ඉහත සඳහන් අයට පරිබාහිර අය විසින් එවනු ලබන මැනුම් ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට මැනුම්පති විසින් ක්‍රියා කරනු ඇත. ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉල්ලා සිටින මැනුම් ඉල්ලීම් ඉටු කිරීමට නම් එම ඉඩම්වල අයිතිය රජය මගින් එම ආයතනයට නිත්‍යානුකූලව බැහැර කර තිබිය යුතුය.

## 3. මැණුම් ඉල්ලීම්

### 3.1 අඩුපාඩු සහිත මැනුම් ඉල්ලීම්

මැනුම්පති වෙත මැනුම් ඉල්ලීමක් සඳහා හඳුන්වාදී ඇති ආ.ඒ.ප. 08 පෝරමයේ විස්තර සම්පූර්ණ කිරීමේදී හා රේඛා චිත්‍ර සඳහා ඉල්ලීම් කරන ආ.ඒ.අ. 118 ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ අඩුපාඩු නිසා බොහෝ ඉල්ලීම් කඩිනමින් නිම කිරීමට අපහසුවී ඇති බව මා වෙත වාර්තා වී ඇත. මෙම අඩුපාඩු අතර ඉඩම් හඳුනාගත නොහැකිවීම, ඉඩමේ නම, ග්‍රා.නි. වසම, කලින් මැන ඇති පිඹුරු විස්තර ඉදිරිපත් නොකිරීම, මායිම් පෙන්වා දෙන නිලධාරීන් ගේ විස්තර නොදීම, ඔවුන්ගේ ලිපිනය සඳහන් නොකිරීම, මැනුම් අවශ්‍යතාවය පැහැදිලි නොකිරීම, පවරා ගැනීමකට අදාළ නම් ගැසට් නිවේදන වැනි අනෙකුත් ලේඛණ ඉදිරිපත් නොකිරීම, මැනුම් ඉල්ලීම් කරන නියමිත බලධාරියා අත්සන් කර නොතිබීම නිල මුද්‍රාව නොමැතිකම වැනි ඉතා වැදගත් තොරතුරු මග හැරීම නිසා මැනුම්පතිගේ කාර්ය මණ්ඩලයට නියමිත මැනුම් සංවිධානය කර ගැනීම අපහසුවී ඇත. ඒ නිසා මැනුම් ඉල්ලීම් සම්පූර්ණ කිරීමේදී මෙම කරුණු නිවැරදිව ඉදිරිපත් කිරීමට ඔබගේ කාර්ය මණ්ඩලය නොපමාව දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න. එලෙස අඩුපාඩු සහිත මැනුම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමෙන් අනවශ්‍ය ප්‍රමාදයන් වලක්වා ගන්නා ලෙසද කාරුණිකව දන්වමි. අඩුපාඩු සහිත මැනුම් ඉල්ලුම්පත් ආපසු යැවීමට මැනුම්පති විසින් කටයුතු කරනු ඇත.

### 3.2 ඉඩම් කැබලි ඒකරාශී කර මැනුම් කිරීම.

මැනුම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී යම් ග්‍රාම නිලධාරී වසමක හෝ ගමක මැනුම් කිරීමට ඇති ඉල්ලීම් ඒකරාශී කොට එක් මැනුම් ඉල්ලීමකට ඇතුලත් කරන්නේ නම්, මැනුම් නිලධාරීන්ට ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කර ගැනීම පහසු වන අතර එමගින් ප්‍රවාහන ගාස්තු, ඉන්ධන, ගමන් වියදම් වැනි වියදම් අවම කර ගැනීමට හැකිවන අතර කාර්ය මණ්ඩලයෙන් උපරිම වාසි සැලසෙන ආකාරයට මැනුම් කටයුතු ඉටුකර ගැනීමටද හැකිවේ.

මේ නිසා වාර්ෂික මැනුම් සැලැස්ම පිළියෙල කිරීමේදී ඒ ගැන ඔබේ දැඩි අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

### 3.3 රජයේ ඉඩම් හඳුනා ගැනීම සඳහා මැනුම් ඉල්ලීම

ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් ඇතැම් ඉඩම් රජයේ ද යන්න හඳුනා ගැනීම සඳහා මැනුම් ඉල්ලීම් ඉදිරිපත් කරන බවත් ඒ සඳහා කාර්ය මණ්ඩල යෙදවීම අසීරු වී ඇති බැවින් එවැනි අවශ්‍යතා ඇති ප්‍රාදේශිය ලේකම්වරුන් එවැනි ඉල්ලීම් යොමු කිරීමට පෙර ඒ ඒ දිස්ත්‍රික්කවල ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරීවරුන් සමග සාකච්ඡා කර පළමුව මැනුම් අධිකාරී කාර්යාලයේ ඇති පැරණි පිඹුරු ඇසුරින් තොරතුරු පරීක්ෂා කර ඉඩම් හඳුනා ගැනීමට පියවර ගත යුතුය. මේ සඳහා ඉල්ලීමක් ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් මැනුම් අධිකාරී වෙත යවා සුදුසු නිලධාරියෙකු යොදවා පරීක්ෂා කර බැලීමෙන් පසු තොරතුරු හඳුනාගත නොහැකි විට පමණක් ඒ සඳහා මැනුම් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

## 4. අනවශ්‍ය මැනුම් ඉල්ලීම්

මැනුම්පති විසින් කාලය මිඩංගු නොකළ යුතු මැනුම් ඉල්ලීම්ද ඉදිරිපත් කරන බව පෙනී ගොස් ඇත. මේ නිසා සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් හෝ මැනුම් ඉල්ලීමක් සඳහා බලය ලත් නිලධාරීන් අනවශ්‍ය මැනුම් ඉල්ලීම් ඉදිරිපත් කළහොත් එවැනි ඉල්ලීම් මින් ඉදිරියට ප්‍රතික්ෂේප කිරීමට මැනුම්පති විසින් ක්‍රියා කරනු ඇත. එවැනි මැනුම් මෙසේය.

i. යම් නීතියක් යටතේ ප්‍රදාන පත්‍රයක් හෝ දීර්ඝකාලීන බදුකරයක් නිකුත් කර අවසන් කර ඇති ඉඩම් නැවත මැනීම
ii. රජයට අත්කර ගැනීමට යෝජනා කර නොමැති පෞද්ගලික ඉඩම් මැනීම (බිම්සවිය මැනීම් හැර)
iii. ඉල්ලීම කරන දිනට වසර 10 ක කාලය ඇතුලත මැනුමක් කර පිඹුරු පිළියෙල කර ඇති රජයේ ඉඩම් නැවත මැනීම.

එසේ වුවද යම් නීතියක් යටතේ දීමනා පත්‍රයක් හෝ දීර්ඝකාලීන බදුකරයක් ලබාදී ඇති ඉඩමක මායිමක් රජයේ ඉඩමක් වන අවස්ථාවක (මාර්ගයක්, ඇලක්, දොළක් හෝ වෙනත් රජයේ ඉඩමක් ) රජයේ ඉඩමේ මායිම පැහැදිලිකර ගැනීම සඳහා කරනු ලබන මැනුම් ඉල්ලීම් තවදුරටත් කරනු ඇත. කෙසේ වුවත් වසර 10ක කාලය තුළ නිම කල මැනුමක් නැවත මැන මායිම් බලා ගැනීම සිදුවුවහොත් ඒ සඳහා ලබාදෙනුයේ තුන්වන ප්‍රමුඛතාවයක් බව සැලකිය යුතුය. මුදල් අය කිරීම මත හෝ ඉහත ගණයේ මැනුම් මින් ඉදිරියට නොකරනු ඇත.

## 5. මැනුම්පති විසින් නිකුත් කරන සිතියම්/පිඹුරු ආරක්ෂා කිරීම හා යාවත් කාලීන කිරීම.

### 5.1 පිඹුරු ඉන්වෙන්ට්‍රි ගත කිරීම

මැනුම්පති විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්, දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානීන් පළාත් ඉඩම් කොමසාරිස් වරුන් වෙත සපයනු ලබන පිඹුරු ඉන්වෙන්ට්‍රි ගත භාණ්ඩයක් ලෙස සලකා ලේඛණ ගත කිරීම අවශ්‍ය බවට මෙයින් උපදෙස් දෙමි. මේ සඳහා වෙනම ලේඛණයක් සකස් කර දැනට ලැබී ඇති සියලුම පිඹුරු එහි ඇතුලත් කර ඉදිරියේදී ලැබෙන සියලු පිඹුරු ලද අවස්ථාවේම ඉන්වෙන්ට්‍රි ගත කළ යුතුය. මේ අනුව සෑම වර්ෂයක් අවසානයේදීම සියලුම පිඹුරු සමීක්ෂණය කර නිවැරදි කිරීම සිදු කළයුතුය.

### 5.2 පිඹුරු පිටපත් නිකුත් කිරීම හා ආපසු භාර ගැනීම

මැනුම්පති විසින් විවිධ ආයතනවලට නිකුත් කරන ලද සියලුම පිඹුරු එම ආයතනවල රාජකාර්ය සඳහා ක්ෂේත්‍රයට නිකුත් කිරීම හා භාර ගැනීම පිළිබඳව නිසි වැඩ පිළිවෙලක් නොමැති කම නිසා වරින් වර පිඹුරු පිටපත් නිකුත් කිරීමට විශාල වියදමක් රජයට දැරීමට සිදුවී ඇත. ඇතැම් පිඹුරු ක්ෂේත්‍ර නිලධාරීන් විසින් රැගෙන යාමෙන් පසු ආපසු භාර නොදීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිතර සිදුවන බව පෙනී ගොස් ඇත. ඒ නිසා ප්‍රාදේශීය ලේකම්වරුන් තමන්ගේ කාර්යාලවල දැනට තිබෙන සම්පත් භාවිතා කරමින් මෙම පිඹුරු ආරක්ෂා කිරීම සඳහා වූ කුඩා ලේඛණාගාරයක් වහාම ආරම්භ කිරීමට පියවර ගත යුතුය. ඔබගේ කාර්යාලයේ විෂය භාර කළමණාකරනවරයෙකු හෝ ඉඩම් පරිහරණ සහකාර නිලධාරියෙකු හෝ වෙනත් සුදුසු නිලධාරියෙකුට පිඹුරු යාවත්කාලීන කරන සටහන් කරුවෙකුගේ රාජකාර් පිළිබඳව විධිමත් පුහුණුවක් ලබාදීම සඳහා ඉදිරියේදී මැනුම්පති විසින් වැඩ පිළිවෙලක් යොදනු ඇත. එම නිලධාරීන් පුහුණු කර ගැනීමෙන් පසු ඔවුන් යොදවා මෙම ලේඛණ යාවත්කාලීන කිරීම හා නඩත්තුව මැනවින් ඉටුවන බවට සියලුම ආයතන ප්‍රධානීන් හා ප්‍රාදේශීය ලේකම්රුන් වග බලා ගත යුතු බවට මෙයින් උපදෙස් දෙමි.

### 5.3 පිඹුරු වල සහතික කළ පිටපත්

සෑම පිඹුරකම සහතික කරනු ලැබූ පිටපතක් ප්‍රාදේශීය ලේකම් හෝ නිසි බලධාරියෙකුට නිකුත් කරන අතර එම පිටපත ක්ෂේත්‍ර වැඩ සඳහා යොදා නොගෙන විධිමත්ව ගබඩා කර ගැනීම අත්‍යවශ්‍යය. අධිකරණ කටයුතු වැනි අත්‍යාවශ්‍ය අවස්ථාවලදී පමණක් මෙම පිටපත භාවිතා කළ යුතු අතර ඒවා ලිපිගොනුවල අමුණා නොතබා ගබඩා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. ගොනුවට හෝ ක්ෂේත්‍ර කටයුතු සඳහා අතිරේක පිටපත භාවිතා කිරීම වඩාත් සුදුසුවේ. තවදුරටත් අවශ්‍ය පිටපත් එයින් ඡායා පිටපත්කරගත යුතුය.

### 5.4 L/96 විස්තර සැපයීම

මැනුම්පති විසින් පිඹුරක් පිළියෙල කරනු ලබන්නේ මැණුම් ඉල්ලීමක් සඳහා බලයලත් නිලධාරීන්ගේ ඉල්ලීම මත නිසා පිඹුරු සකස් කිරීමෙන් පසුව අදාල කටයුතු නිම වුවාද යන්න එම ඉඩමේ ඊළඟ මැනුම් කටයුතුවලදී වඩා වැදගත් වේ. ඒ සඳහා L/96 මගින් ඉල්ලා සිටින විස්තර අනිවාර්යයෙන්ම මැනුම්පතිට දැන ගැනීමට අවශ්‍ය වේ. විශේෂයෙන් අත්කර ගැනීමේ කටයුතු

L/96 විස්තර සැපයීම මගින් පහසු කරනු ඇත. මේ මගින් මැනුම්පතිවරයා හා ඉඩම් රාජකාරීවල නියුක්ත බලධාරීන් විසින් ගනු ලබන තීරණ පිළිබඳ දැනුවත් වීමක් සිදුවන අතර එමගින් පිඹුරු යාවත්කාලීන වීමක් ද සිදු වේ. මැනුම්පති විසින් ඉදිරිපත් කරන L/96 ආකෘතිවලට දැනට ප්‍රාදේශීය ලේකම්වරුන් ගෙන් පිළිතුරු ලබා ගැනීමට නොහැකිවීම නිසා ඇතැම් මැනුම් පිළිබඳව පියවර ගැනීම ප්‍රමාද වී ඇත. මෙය මැනුම් ඉල්ලීම් කරන නිලධාරීන්ට පෙරලා ප්‍රමාදයන්ට ලක්වීමට සිදුවන කාරණයක් බැවින් මේ සම්බන්ධවද නිසි අවධානය යොමු වීම අවශ්‍යය. L/96 ඉල්ලුම් පත්‍ර සඳහා පිළිතුරු ලබාදෙන ආකාරය පිළිබඳව ඔබගේ කාර්යාලයේ මෙම විෂය සඳහා යොදවා ගන්නා නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීමට මැනුම්පති ක්‍රියා කරනු ඇත.

## 6. රේඛා චිත්‍ර ඉල්ලීම

රජයේ ඉඩමක් මැන පිඹුරක් පිළියෙල කළ පසු රේඛා චිත්‍ර ලබා ගැනීමට සිදුවේ. රජයේ ඉඩම් සඳහා නිකුත් කරන නීත්‍යානුකූල ලියවිලි සමග ඇමුණා තැබීම සඳහා මෙම ලේඛණ අත්‍යාවශ්‍ය වන බව ඔබ දන්නා කරුණකි. දැනට මැනුම්පති විසින් නිකුත් කරන රේඛා චිත්‍ර පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| L | රේඛා චිත්‍ර | බදුකරයක් නිකුත් කිරීම සඳහා |
| O | රේඛා චිත්‍ර | පූර්ණ අයිතිය ඇති දීමනා පත්‍රයක් සඳහා |
| R | රේඛා චිත්‍ර | මධ්‍යම පන්තික ඉඩම්වල දීමනා පත්‍ර සඳහා හෝ ඉඩම් නිදහස් කිරීමේ ආඥා පනත යටතේ නිකුත් කරන දීමනා පත්‍ර සඳහා |
| S | රේඛා චිත්‍ර | නිරවුල් කිරීමේ කටයුතු සඳහා |
| V | රේඛා චිත්‍ර | පැවරුම් නියෝග සඳහා |

රේඛා චිත්‍රයක් ඉල්ලීම සඳහා දැනට භාවිතා වනුයේ ආ.ඒ.අ. 118 ආකෘතියයි. එම ආකෘතියේ විස්තර නිවැරදිව ලබා නොදීම නිසා බොහෝ විට එම රේඛා චිත්‍ර නිකුත් කිරීමට මැනුම්පතිට අපහසුවී ඇත. විශේෂයෙන් දීමනා පත්‍රකරුවන්ගේ ලිපිනය නිවැරදිව සඳහන් නොකිරීම දීමනා පත්‍රය අවශ්‍ය වන කාරණය අනුව කුමන රේඛා චිත්‍ර අවශ්‍යද යන්න පැහැදිලි නොකිරීම, රේඛා චිත්‍ර ලබාදීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිගොනු අංකය සඳහන් නොකිරීම වැනි කරුණු කෙරේ ඔබගේ පූර්ණ අවධානය යොමු කරන අතර, එම අඩුපාඩු මග හරවා ගැනීම මගින් ඔබගේ අවශ්‍යතා ඉක්මණින් ඉටු කර දීමට මැනුම්පතිට පහසුවේ.

## 7. පිඹුරු වලට අදාල කටයුතු අවසන් කිරීමෙන් පසු කාර්ය භාරය

රජයේ ඉඩම් පිළිබඳව පිළියෙල කරනු ලබන පිඹුරුවලට අනුව කටයුතු නිම කිරීමෙන් පසුව එම විස්තර මැනුම්පති වෙත සැපයීමෙන් අදාල පිඹුරු යාවත්කාලීන කරගත හැකිවේ. විශේෂයෙන් අත්කර ගැනීමේ කටයුතු අවසන් කල පසු මෙම විස්තර, බදු බලපත්‍ර නිකුත් කල පසු එම විස්තර, දීමනාපත්‍ර, හිමිකම් සහතික නිකුත් කළ පසු එම විස්තර නැවත මැනුම්පතිවෙත ලබාදීමෙන් පිඹුරු යථාවත් කර ගැනීම පහසු වනු ඇත.

කරුණාකර මෙම උපදෙස් අනුව ඔබගේ මැනුම් ඉල්ලීම් සංවිධානය කර ගැනීමටත් කාර්යාලයේ මැනුම් ලේඛණ කළමණාකරණය ශක්තිමත් කර ගැනීමටත් නොපමාව පියවර ගැනීම මගින් මැනුම්පතිගේ කාර්යයන් කඩිනම් කර දීමට ඔහුට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට සහාය දෙන මෙන් ඉල්ලමි.

ලේකම්
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

පිටපත්:

1. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
2. සියලුම සංස්ථා මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන හා රජයේ ආයතන ප්‍රධානීන්
3. ඉඩම් කොමසාරිස් ජනරාල්
4. මැනුම්පති
5. ඉඩම් නිරවුල් කිරීමේ කොමසාරිස්
6. හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්
7. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
8. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්

) කරු.
) දැ.ගැ.ස./
) අ.ක.ස.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL' S DEPARTMENT

නො.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறீஸ் மாவத்தை, கொழும்பு 07.
No 07, Gregory's Avenue, Clombo 07.

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2684051

ඊමේල් / ஈ-மெயில் / E- mail } Landcom@sltnet.lk

අංකය / இல. } 5/2/6/2008 ඔබේ අංකය / உமது இல. / YOUR NO }

දිනය / திகதி / DATE } 2008.02. 12

චක්‍රලේඛ අංකය:-2008/01

සියලුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත,

**<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අවසර පත්‍ර නිකුත් කිරීම හා දීමනා පත්‍ර නිකුත් කිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධ. ඉඩම් හා ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ 2007/4 හා 2007.11.12 දිනැති චක්‍රලේඛයට කාරුණික අවධානය යොමු කරමි.

2. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර මත බෙදා දී ඇති ඉඩම් සදහා දීමනා පත්‍ර සකස් කිරීමේදී දිවයිනේ විවිධ ප්‍රදේශවලින් වාර්තා වී ඇති කරුණු ද මහජන පැමිණිලි පිළිබද පාර්ලිමේන්තු කොමසාරිස්ගේ 2007 වර්ෂයේ වාර්ථාවේ සදහන් කරුණු ද සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පිළියෙල කර එවනු ලබන දීමනා පත්‍ර සමග සහතිකයක් ලබාදිය යුතු බවට ඉහත චක්‍රලේඛයේ 6 ඡේදය මගින් ඔබට උපදෙස් දී ඇත.

3. 2008.01.24 දින පැවති පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ගේ රැස්වීමෙදි මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කල අතර ප්‍රාදේශීය ලේකම් විසින් එලෙස සකස් කර එවනු ලබන දීමනා පත්‍ර සමග එවිය යුතු සහතිකයේ ආදර්ශයක් මේ සමග එවමි.කරුණාකර මින් ඉදිරියට සෑම දීමනා පත්‍රයක් සම්බන්ධයෙන් අදාළ සහතිකය එවීමට කටයුතු කරන්න.මෙම සහතිකය නොමැති දීමනා පත්‍ර අතිගරු ජනාධිපතිතුමාගේ අත්සන ලබා ගැනීමට යොමු නොකරන බවද සටහන් කර ගන්නේ නම් මැනවි.

එස්.ඩී.ඒ.බී.බොරලැස්ස,
ඉඩම්කොමසාරිස් ජනරාල්.

පිටපත්:- 01. ජනාධිපති ලේකම්
02.ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
03. ලේකම්,
ඉඩම් හාඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.
04.සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
05. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
06.අන්තර් පළාත් නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන්